# සඳැස් කවියට අත්වැලක් 2



ආචාර්ය
ඥානතිලක හේවාගමගේ

## ගණ සහ ගණ පිහිටුවීම සැකෙවින්

සිංහල සඳැස් කවියේ ඡන්දස් වර්ග දෙකක් ඇති බව මෙම ලිපි පෙළේ පළමු කොටසේ දී සඳහන් කරන ලදී. ඒවා නම් මාත්‍රා ඡන්දස සහ වර්ණ හෙවත් ගණ ඡන්දසයි. සිංහල සඳැස් කවිය මාත්‍රා වෘත්තයෝ (විරිත්) ප්‍රධාන කොට ඇතත් ගණ ඡන්දසට අනුව කවි ලිවීම ද බෙහෙවින් දක්නට ලැබේ. යම් යම් කාලවල දී එහි අඩු වැඩිවීම් දක්නට ලැබුණ ද ගණ පිහි-ටුවා කවි පබැඳීම, සිංහල සඳැස් කවියේ ගැඹුරු වූ ශාස්ත්‍රානුකූල මෙහෙවරක් බව මෙහිදී සඳහන් කළ යුතුය. ගණ පිහිටුවා කවි පබඳින ඉතාමත් අලංකාර වෘත්ත රාශියක් සිංහල කවිය සතුව ඇත. ඒවා පිළිබඳව විස්තරාත්මක අගැයීමක් පසු කොටසක දී කරන්නට බලාපොරොත්තුවන අතර මෙහිදී අපි ගණ පිළිබඳව වූ අර්ථ දැක්වීම් සහ ගණ පිහිටුවා කවි පද බැඳ ඇති අයුරු සරලව විග්‍රහ කරමු.

වර්ණ ඡන්දසෙහි ගණ, වර්ණ හෙවත් අක්ෂර සංඛ්‍යාව අනුව නිර්ණය වේ. එහි එන එක් එක් ගණයක වර්ණ හෙවත් අක්ෂර තුනක් අඩංගුය. එම අක්ෂරවල ඇති මාත්‍රා ගණන සහ ඒවා යෙදී ඇති ආකාරය අනුව මෙම ගණ එකිනෙකට වෙනස් වේ. ගුරු අක්ෂර තුනක් වේ නම් එය 'ම ගණය' වන අතර ලඝු අක්ෂර තුනක් වේ නම් එය 'න ගණය' වේ. මුල, මැද, අග ගුරු අක්ෂර වේ නම් ඒවා පිළිවෙලින් 'බ ගණය', 'ද ගණය', 'ස ගණය' නම් වේ. එලෙසම මුල, මැද, අග ලඝු අක්ෂර වේ නම් ඒවා පිළිවෙලින් 'ය ගණය', 'ර ගණය', 'ත ගණය' වේ. මේ අනුව වර්ණ ඡන්දසෙහි එන ගණ සංඛ්‍යාව අටකි. මෙහිදී සැලකිය යුතු තවත් විශේෂ කරුණක් වන්නේ මෙහි එන 'ද ගණය' සමහර පොත් පත්වල 'ජ ගණය' ලෙස හැඳින්වීමයි.

මෙලෙස අර්ථ දක්වා ඇති ගණ පිහිටුවමින් කවි පබැඳීමේ කලාවේ දී සමහරක් කවියන් මෙන්ම රසිකයන් අතර ද නොයෙකුත් ඇදහීම් සහ විශ්වාස පැවැතුණි. අද ද පවතී. ඒ අනුව සමහරක් ගණ සුබ ගණ ලෙස ද, සමහරක් අසුබ ගණ ලෙස ද, තවත් සමහරක් උදාසීන ගණ ලෙස ද සැලකුණි. එලෙසම මෙම ගණ ඉර, හඳ, පොළව යන ග්‍රහ වස්තූන්ට ද ජලය, වාතය, ගින්දර යන මූල පදාර්ථයන්ට ද අදහන සමහරක් දෙවිවරුන්ට ද සම්බන්ධ යයි සැලකුණි. මේ අනුව සෙත් කවි සහ වස් කවි යනුවෙන් වූ විශේෂ කවි පබැඳීම් ද මෙම ගණ පිහිටුවීම පදනම් කොට සිදුවුණි. එමෙන්ම 'ජය මංගල ගාථා', 'නරසීහ ගාථා' යනාදිය ද මෙලෙස ගණ පිහි-ටුවා පද බැඳ ඇති ගාථා විශේෂයන්ය. සඳැස් කවිය පිළිබඳව වූ සමහර ශාස්ත්‍රීය පොත් පත්වල ද මෙම සුබ අසුබ කරුණු ගැන විස්තරාත්මකව සඳහන් කොට ඇත. අපගේ විශ්වාස කිරීම්වල පදනම කෙසේ වෙතත් සඳැස් කවියේ අත්පොත වන 'එලු සඳැස් ලකුණ' හි මෙන්ම 'සිදත් සඟරාව' හි ද මේ පිළිබඳව සඳහන් කර ඇති කරුණු සංශිප්තව මෙහි දැක්වීම උචිත වේ.  පළමුවන වගුව බලන්න

| ගණ නාම | ප්‍රස්ථාරය | දේවතා | මිත්‍රාදි | ඵල | ශුභාදි | උදාහරණ |
|---|---|---|---|---|---|---|
| ම ගණ | ᴗ ᴗ ᴗ | මහී | මිත්‍ර | ශ්‍රී | ශුභ | සෙත්දේවා |
| ය ගණ | - ᴗ ᴗ | ජල | දාස | ආයුෂ | ශුභ | සුගත්දෙවි |
| ර ගණ | ᴗ - ᴗ | අග්නි | ශත්‍රැ | දාහ | අශුභ | රෞද්‍රබික් |
| ස ගණ | - - ᴗ | වායු | ශත්‍රැ | විදේශ ගමන | අශුභ | ඇවිදී |
| ත ගණ | ᴗ ᴗ - | ආකාශ | උදාසීන | ශූන්‍ය | අශුභ | ආකාශ |
| ද ගණ | - ᴗ - | රවි | උදාසීන | රුජා | අශුභ | රුදාව |
| බ ගණ | ᴗ - - | චන්ද්‍ර | දාස | යශස් | ශුභ | සේකර |
| න ගණ | - - - | දේව | මිත්‍ර | වෘද්ධි | ශුභ | වුවන |

(මූලාශ්‍රය - එලු සඳැස් ලකුණ)

පළමුවන වගුව

'එලු සඳැස් ලකුණ' හි දක්වා ඇති පරිදි කවියක් ආරම්භයේ දී හෝ කාව්‍ය නායකයාගේ නාමය දෙපසට සුබ ගණ යෙදිය යුතුය. නැති නම් දුෂ්ඨ ඵල ඇති වේ. කෙසේ නමුත් කවියක් ආරම්භයේ දී අසුබ ගණයක් යෙදුනහොත් එය තුලනය කිරීමට එයට සීහෙන්න තවත් සුදුසු ගණයක් දෙවනුව යෙදීමෙන් දුෂ්ඨ ඵල ඇතිවීම වලක්වාගත හැකි බව එම පොතෙහිම වෙනත් තැනක සඳහන් කර ඇත. එය පහත දැ-ක්වෙන දෙවන වගුව නිරීක්ෂණය කිරීමෙන් වටහාගත හැකිය.

| | මිත්‍ර ගණ වුවොත් | දාස ගණ වුවොත් | උදාසීන ගණ වුවොත් | ශත්‍රැ ගණ වුවොත් |
|---|---|---|---|---|
| මිත්‍ර ගණයෙන් | සමෘද්ධි ආදිය වේ | ජයාදිය වේ | ශුභ වේ | බන්ධු පීඩා වේ |
| දාස ගණයෙන් | සර්ව කාය¥ සිද්ධි වේ | සියලු ලාභ වේ | ධන නාශය වේ | ශෝක වේ |
| උදාසීන ගණයෙන් | ස්වල්ප කාය¥ සිද්ධි වේ | ප්‍රභුත්වය වේ | මන්ද ධෛය¥ වේ | බන්ධු වෛර වේ |
| ශත්‍රැ ගණයෙන් | භ්‍රම-නාශාදිය වේ | භාය¥නාශය වේ | සිය කුල නැසීම වේ | විනාශය වේ |

දෙවන වගුව

පෙර දවසේ මෙන්ම අද ද සිටින සමහරක් සඳැස් කවියන් මෙම නියාමයන්ට ගරු කරමින් කවි පබඳිනවා සුලභව දක්නට ලැබෙන කරුණකි. කෙසේ නමුත් ශබ්දාර්ථ, ලාලිත්‍ය, ඖචිත්‍ය වැනි කරුණු සැලකිල්ලට ගැනීමේ දී මේවා පිටුපස කිසියම් වූ ශාස්ත්‍රීය වටිනාකම් ද ඇති බව අපට අමතක කළ නොහැකිය.

මෙලෙසම මාත්‍රා ඡන්දසෙහි ද ගණ බෙදීමක් දක්වා ඇත. මෙහි එක් එක් ගණයක මාත්‍රා සතර බැගින් වේ. ගුරු සහ ලඝු අක්ෂර යෙදීම අනුව එහි විධි සංඛ්‍යාව පස්වැදෑරුම් වන අතර එය පහත දැක්වෙන අයුරින් වේ.

| | | |
|---|---|---|
| ගුරු ගුරු | ᴗ ᴗ | සර්ව ගුරු ගණය |
| ලඝු ලඝු ගුරු | - - ᴗ | ත ගණය |
| ලඝු ගුරු ලඝු | - ᴗ - | ද ගණය |
| ගුරු ලඝු ලඝු | ᴗ - - | බ ගණය |
| ලඝු ලඝු ලඝු ලඝු | - - - - | සර්ව ලඝු ගණය |

මෙම ගණ සංස්කෘත ඡන්දස් ශාස්ත්‍රයේ එන ගණ වශයෙන් සැලකේ.

සිංහල ඡන්දස් ශාස්ත්‍රයේ දී ගණ පිහිටුවා කවි පබැඳීමට භාවිත කරන්නේ වර්ණ ඡන්දසට අයත් ගණයන්ය. මෙයට අදාලව උදාහරණ කිහිපයක් පිළිබඳව සලකා බැලීම කරුණු තවදුරටත් අවබෝධ කරගැනීමට පහසුවක් විය හැක. පහත දැක්වෙන්නේ 'ප්‍රාතිහාර්ය ශතකය' නම් පොතෙන් උපුටා ගත් ගණ ඡන්දසට අයත් මාලනී විරිතෙන් පබැඳුන කවියක්ය.

පර වැඩ   ඇදුරාණෝ   ලෝ සියල්   එක්   නෙතාණෝ
දියටෙක   වියතාණෝ   මොක්පුරේ   එක්   රජාණෝ
භව සිඳු   බසුරාණෝ   තිත් නළන්   මත්   ගජාණෝ
සුර නර   ඉසුරාණෝ   සව් සැපත්   කප්   රුකාණෝ

මෙම කවියේ පාදයක පිළිවෙලින් 'න ගණ' දෙකක් ද 'ම ගණ' එකක් ද සහ 'ය ගණ' දෙකක් ද වන අතර පාද හතරේම සංයුතිය මේ ආකාර වේ. පාදයක මාත්‍රා ප්‍රස්ථාරය සහ ගණ පිහිටුවා ඇති ආකාරය පහතින් දක්වා ඇත.

| - - - | - - - | ᴗ ᴗ ᴗ | - ᴗ ᴗ | - ᴗ ᴗ |
|---|---|---|---|---|
| න | න | ම | ය | ය |

පහත දැක්වෙන සිව්පද කවිය තිසර සංදේශයෙන් උපුටා ගත්තකි. පාදයක පිළිවෙලින් 'ස ගණ', 'න ගණ', 'ද ගණ' ('ජ ගණ'), 'න ගණ', 'බ ගණ', 'ස ගණ' යන මේ සය යොදා බැඳ ඇති මෙම කවියේ විරිත 'කමලා විරිත' නම් වේ.

කැලුමින්   යුතු ලකරින් සොඳ සුවඳින් නන   වෙසිනී
සැදෙමින්   තිර අතුරෙන් එළි බසිමින් ඉඟි   ලෙසිනී
කියමින්   හිමි නිරිඳුන් සොමි තියු ගී රස   බසිනී
රඟමින්   ලිය සමඟින් සිටි නළුකැන් දකු   තොසිනී

මෙහි මාත්‍රා ප්‍රස්ථාරය සහ ගණ පිහිටුවා ඇති අයුරු පහතින් දක්වා ඇත.

| ᴗ ᴗ - | ᴗ - - | - ᴗ - | - ᴗ - | ᴗ ᴗ |
|---|---|---|---|---|
| ත | බ | ද | ද | ගු ගු |

ගණ ඡන්දසට අයත් තවත් විශිෂ්ඨ විරිතක් වන්නේ 'වසන්ත තිලකා විරිත' නම් වූ සිලෝ විරිතයි. බෞද්ධ චාරිත්‍රානුකූලව පැවැත්වෙන විවාහ, ගෙට ගෙවැදීම්, පිළිගැනීම් වැනි උත්සව අවස්ථාවල දී ආශීර්වාද කිරීමට ගායනය කරන ජය මංගල ගාථා පද බැඳ ඇත්තේ මෙම විරිතට අනුවය. එහි මුල් ගාථාව පහතින් දැක්වේ.

බාහුං සහස්ස මභිනිම් මිතසායු දං තං
ගිර්මේකලම් උදිත ඝෝර රසේන මාරම්
දානාදි ධම්ම විධිනා ජිතවා මුණින්දෝ
තම්තේජසා භවතු තේ ජය මංගලානී

17 වන පිටට